**ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 3,552.71 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 3,173.76 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 378.95 ක් හෙවත් සියයට 10.66 ක ප්‍රතිපාදන ඉතිරිව් තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 1,068.81 | 964.34 | 104.47 | 9.77 |
| මූලධන | 2,483.90 | 2,209.42 | 274.48 | 11.05 |
| එකතුව | 3,552.71 | 3,173.76 | 378.95 | 10.66 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 10201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 19 | 18.92 | 10.50 | 11 | 70 | 44.66 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0266/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 3.0 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ශේෂ එකතුව රු.මිලියන 85.81 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0085/000 | 0.03 |
| 6000/0000/00/0002/0102/000 | 0.15 |
| 6000/0000/00/0016/0050/000 | 85.18 |
| 6000/0000/00/0018/0062/000 | 0.45 |
| එකතුව | 85.81 |

## 2.5 විගණන නිරීක්ෂණය

මුදල් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත. කෙසේ වුවද, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් ගණන් දීමේ නිලධාරී ලෙස පිළියෙල කර ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉහත සඳහන් විසර්ජන ගිණුමට හෝ සැසඳුම්

ප්‍රකාශනවලට පරිබාහිර මූල්‍ය ප්‍රකාශනයන් හෙයින් එම ජනරජයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාවෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් කර නොමැත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණ බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන චක්‍රලේඛය |
| (ආ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඇ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 10201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සේවය අතහැරගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 901,667 ක් විය. එය වර්ෂ 02 සිට 12 දක්වා කාල පරාසයක සිට පැවත එමින් පවතී. එම ණය ශේෂය අයකර ගැනීමට හෝ සුදුසු පියවර ගෙන කටයුතු අවසන් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) මාසිකව පාලන ගිණුම් සකස් කිරීමට හා සී.සී. 10 ලේඛනය ශේෂ කිරීමට සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

### 3.3 කාර්යසාධනය

---

මුදල් අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එය 2015 වර්ෂයේදී හා 2016 වර්ෂයේදී පිළිවෙලින් රු. මිලියන 270 ක් හා රු. මිලියන 600 ක් වශයෙන් විය. 2015 වර්ෂයේදී එම මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර 2016 වර්ෂයේදී ද එය අපේක්ෂිත කාර්යයට නොයොදවා මුලුමනින්ම වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. එසේ වුව ද වෙනත් ප්‍රමුඛතා සහ භාණ්ඩාගාර නව ගොඩනැගිල්ලේ කටයුතු කඩිනමින් අවසන් කිරීමේ අවශ්‍යතාවය හේතුකොටගෙන අදාළ වෙන්කළ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි ප්‍රකාරව වෙනත් වැය විෂයකට මාරුකර ඇති බව අමාත්‍යාංශය පවසා ඇත.

## 3.4 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ අයවැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනම ඇතුළත් වන පරිදි පිටපත් 850 ක් හා ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පිටපත් 200ක් වශයෙන් මුළු පිටපත් 1050 ක් මුද්‍රණය කර තිබුණි. ඒ සඳහා එකතුව රු.මිලියන 20.75 ක් වැයකර තිබුණු අතර මාධ්‍ය තුනම ඇතුළත් එක් මුද්‍රිත පිටපතක් සඳහා රු. 22,774 ක් හා ඉංග්‍රීසි මාධ්‍ය මුද්‍රිත පිටපතක් සඳහා රු. 6,946 ක් වන ලෙස ඉතා අධික පිරිවැයක් දරා තිබුණි.

(i) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට බැහැරවන අවස්ථාවලදී අනුගමනය කළ යුතු 2014 ජූලි 04 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 හි විධිවිධාන වලට පටහැනිව කටයුතු කර තිබුණු අවස්ථා පහත පරිදි විය.

* රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව කටයුතු කරන්නේ නම් රු. මිලියන 10 ට වැඩි වටිනාකම් සහිත ප්‍රසම්පාදන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත් රු.මිලියන 20.75 ක් වූ මෙම ප්‍රසම්පාදනය, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත කර තිබුණි.

* රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැර වන අවස්ථාවලදී එසේ බැහැරවීමට හේතු පැහැදිලිව ලිඛිතව වාර්තා කළයුතු වේ. එහි පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන කමිටුව විසින් උපරිම පිටපත් සංඛ්‍යාව 1000 කට යටත්ව මුද්‍රණය කිරීම අනුමතකර තිබුණි. මෙම අනුමත සීමාව පිටපත් 50 කින් ඉක්මවමින් පිටපත් 1050 ක් මුද්‍රණය කර තිබුණි.

(ආ) රජයේ සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණ මන්ත්‍රීවරුන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් 2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් රු.මිලියන 3.28 ක් පෞද්ගලික ප්‍රවාහන සේවා ආයතනයකට ගෙවා තිබුණි. එම ගෙවීමට අදාළව මුදල් අමාත්‍යවරයා විසින් 2016 ජූලි 11 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ, ප්‍රවාහන සේවා සැපයුම් වෙළඳපොලේ තරඟකාරී මිල ගණන් සැලකිල්ලට ගෙන ප්‍රවාහන සේවා ආයතනයකින් සේවා ලබාගත් බව සඳහන්කර තිබුණි. එසේ වුවද, එලෙස අනුමත රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තරඟකාරී මිල ගණන් පදනම්ව සැපයුම්කරුවෙකු තෝරා නොගෙන සෘජුවම එක් ආයතනයක් තෝරාගෙන තිබුණු බව විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනු අනුව නිරීක්ෂණය විය.

(ඇ) අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ ඇමතුම් පද්ධතියේ අළුත්වැඩියා කිරීම සඳහා තරඟකාරී මිල ගණන් කැඳවීමක් කර නොතිබුණි. මෙය විශේෂ අවස්ථාවක් ලෙස සලකා, එම පද්ධතියේ මූලික සවිකිරීම් කරන ලද පෞද්ගලික ආයතනය වෙතින් රු.මිලියන 1.10 ක මුදලකට සෘජුවම ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණයකර තිබුණි. එසේ වුවද, මේ අයුරින් සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 මාර්ගෝපදේශය ප්‍රකාරව අදාළ විය යුතු අවස්ථානුගත කරුණු කිසිවක් මෙම ප්‍රසම්පාදනය සිදුවන අවස්ථාවේදී පැවති බවට විගණනයට තහවුරු නොකෙරුණි.

**3.5 අවිධිමත් ගනුදෙනු**

(අ). ශ්‍රී ලංකාවට විදේශ ආයෝජකයින් ගෙන්වා ගැනීම සඳහා ජාත්‍යන්තර ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රචාරක වැඩසටහන් සිදුකරවා ගැනීම වෙනුවෙන් ජාත්‍යන්තර මාධ්‍ය ආයතන දෙකක් වෙත 2016 වර්ෂයේදී එකතුව රු.මිලියන 40.65 ක් ගෙවා තිබුණි. එසේ වුවද, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර විදේශීය ආයෝජන ආකර්ශනය කල හැකි විකල්ප මාර්ග පිළිබඳ අධ්‍යනයක් කර ආයෝජන ප්‍රවර්ධනය හා සම්බන්ධිත ආයතන හා එක්ව ආයෝජන ප්‍රවර්ධන වැඩපිළිවෙලක් සැලසුම් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ). මෙම මාධ්‍ය සේවා සපයා ගැනීමේදී, මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක හා ගුණාත්මකභාවයෙන් ඉහළම සේවා ආයතන තෝරා ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යයන් සිදුනොකර මෙම මාධ්‍ය සේවා ආයතන සෘජුවම තෝරාගෙන තිබුණි.
**එසේ වුවද මෙම ගනුදෙනු සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පසුකාලීනව ලැබී ඇති බව නිරීක්ෂණය විය.**

**3.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 31 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 9 | 6 | 3 |
| (iii) | ද්විතියික මට්ටම | 154 | 119 | 35 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 183 | 178 | 5 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 57 | 36 | 21 |
| | **එකතුව** | 449 | 370 | 79 |

ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු අතර නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් තනතුරක් ඇතුළුව ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ පුරප්පාඩු 06 ක් විය.